# කොළඹ ජනතාවට ගෞරවනීයව ක්‍රියා කරන්න විශේෂ වැඩපිළිවෙළක් හඳුන්වා දෙනවා

## - පුරපති අපේක්ෂක මිලින්ද මොරගොඩ

අනුර ප්‍රේමලාල් සහ
ස්වර්ණා විජේකෝන්

කොළඹ නගරයේ පදිංචි සියලු ජනවර්ගවලට අයත් ජනතාවට ඔවුන්ගේ අනන්‍යතා ආරක්ෂා කරගෙන ගෞරවනීය ලෙස කටයුතු කරගෙන යාමේ පහසුකම් සැලසීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් හඳුන්වා දෙන බව කොළඹ නගර සභාවේ පුරපති අපේක්ෂක මිලින්ද මොරගොඩ මහතා කරුණු අවධාරණය කරයි.

ඒ අනුව ආදර්ශයක් ලෙස කොළඹ නගරයේ පදිංචි මුස්ලිම් ජනතාව කරුණු දහයකින් යුතුව කෙටුම් පතක් ඉදිරිපත් කර තිබෙන බව හෙතෙම පෙන්වා දුන්නේය.

මේ කාර්ය ශක්තිමත් කර ගැනීම සඳහා කමිටුවක් පත්කොට සියලු ජනවර්ග ප්‍රජාවන්ගෙන් අදහස් ලබා ගැනීමක් සිදු කෙරෙන බව ඒ මහතා දන්වා සිටියේය.

කොළඹ වෙසෙන සියලුම ජන කණ්ඩායම් අතර එකිනෙකාට ගරු කිරීම සහ එකිනෙකා පිළිබඳ අවබෝධය ඇතිකරවන දේශපාලන සංස්කෘතියක් නිර්මාණය කිරීම ඇතුළු මුස්ලිම් ජනතාවගේ ජීවන ක්‍රම පිළිබඳ අනෙකුත් ජනතාව තුළ අවබෝධයක් ඇතිකිරීම, හලාල් සහතික ලබාදීම, ඇතුළු ඒ අයගේ සංස්කෘතික අංග රැක ගැනීම සඳහා කරුණු 10කින් යුතු ආදර්ශය ඉදිරිපත් කර ඇත.

මේ සඳහා ඕනෑම අයකුට අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීමේ පහසුකම් ඇති කර ඇතැයි මිලින්ද මොරගොඩ මහතා වැඩිදුරටත් පැවැසීය.